# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
# පරිසර අමාත්‍යාංශය
# ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.
# සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2026

**01)** 2026 වර්ෂයේදී භාණ්ඩ, සේවා හා ඉදිකිරීම් කටයුතු සඳහා පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වීමට කැමති පිළිගත් කොන්ත්‍රාත්කරුවන් සහ සැපයුම්කරුවන්ගෙන්, රාජ්‍ය ආයතන, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල, සමූපකාර සමිති, පෞද්ගලික වෙළඳ ආයතන, බෙදාහැරීම් කරනු ලබන ආයතන, සහ ලියාපදිංචි ගරාජ් හා සේවා ස්ථානවලින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.)** මෙම භාණ්ඩ, සේවා සැපයීම සහ ඉදිකිරීම කටයුතු පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයට හා පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයටත්, හක්ගල, ගම්පහ, හම්බන්තොට (මිරිජ්ජවිල) අවිස්සාවේල්ල (ඉළුක්ඕවිට) යන ස්ථානවල පිහිටි උද්‍යානවලටත්, ගනේවත්ත වන ඖෂධ උද්‍යානය, මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානයට මෙන්ම කොළඹ, මහනුවර, නුවරඑළිය, හා අනුරාධපුර නගරවල පිහිටි ජනාධිපති මැදුරු හා කොළඹ හා නුවරඑළිය අගමැති මැදුරු උද්‍යාන සහ කොළඹ, මහනුවර සහ ත්‍රිකුණාමලය පිහිටි පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක සහ කොළඹ නාරාහේන්පිට පිහිටි සුවහස් මල් සෙවන ඒකකය සඳහා අවශ්‍ය වේ.

<u>**03.)**ලියාපදිංචි විම සඳහා අවශ්‍ය පොදු කොන්දේසි හා නියමයන්</u>

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ව්‍යාපාරිකයන් විය යුතුය. (සැපයුම්කරුවන් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ලේඛණ මගින් ලියාපදිංචිය තහවුරු කළ යුතුය.)

ii. කොන්ත්‍රාත්කරුවන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචිය තහවුරු කළ යුතුය. වලංගු ලියාපදිංචියක් ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

iii. සියළුම අයදුම්කරුවන් මෙම දෙපාර්තමේන්තුවේ සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලෙස ලියාපදිංචි වීමට අයදුම් කල යුත්තේ මෙම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන අයදුම්පත්‍රවල පමණි.

iv. කොන්ත්‍රාත්කරුවන් හා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත් හා ලියාපදිංචි විම සඳහා අවශ්‍ය පොදු කොන්දේසි හා නියමයන් පුවත්පත් නිවේදනයේ පිටපතක් සමග ඉහත අංක 02 ඡේදයේ සඳහන් කාර්යාලයන්හිදී **2025.10.15** දින සිට **2025.11.30** වන දින දක්වා පෙ.ව **9.00** සිට ප.ව **3.00** දක්වා පමණක් රජයේ කාර්යාල දිනවලදී ලබා ගත හැකි අතර ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන්ද **(www.botanicgardens.gov.lk)** අයදුම්පත්‍ර භාගත කල හැක. අයදුම්පත්‍ර වෙබ් අඩවියෙන් හැර පහත අංක (v) සඳහන් කාර්යාල වලින් මිලදී ගන්නේ නම් එම (v) සඳහන් ලියාපදිංචි ගාස්තුවට අමතරව අයදුම්පත්‍ර ගාස්තු ලෙස රු. **2,000.00**ක මුදලක් ගෙවිය යුතුවේ. එය පිටපත් කර ගැනීම සම්බන්ධයෙන් කිසිදු බාධාවක් නොමැත.

v. සැපයුම්කරුවන් ලියාපදිංචිය සඳහා ආපසු නොගෙවන රු.**1,000.00**ක මුදලක් (එක් කාණ්ඩයක් සඳහා) අය කරනු ලබන අතර කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය සඳහා ආපසු

නොගෙවන රු.**2,000.00** ක මුදලක් අයකරනු ලැබේ. මෙම අයදුම්පත්‍ර ගාස්තු පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ පිහිටි ප්‍රධාන කාර්යාලයෙන් හා පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය, හක්ගල, ගම්පහ, ගනේවත්ත, හම්බන්තොට (මිරිජ්ජවිල) හා අවිස්සාවේල්ල (ඉළුක්ඕවිට) පිහිටි උද්භිද උද්‍යාන කාර්යාල හා අංක **43**, කිරිමණ්ඩල මාවත, නාරාහේන්පිට, කොළඹ **05** යන ස්ථානයේ පිහිටි නාරාහේන්පිට පිහිටි සහකාර අධ්‍යක්ෂ කාර්යාලයට මුදලින් ගෙවා ලබාගන්නා <u>පොදු **172** ලදුපතේ පිටපතක් අයදුම්පත්‍රය සමඟ අමුණා එවීම අනිවාර්යය වේ.</u>

**vi.** එමෙන්ම ලංකා බැංකුවේ පේරාදෙණිය ශාඛාවේ **7040743** දරණ ගිණුම් අංකයට සෘජුව තැන්පත් කිරීමෙන් ලබා ගන්නා ලදුපත හෝ විද්‍යුත් පිටපත අයදුම් පත්‍රය සමඟ අමුණා එවීමද කළ හැක. නමුත් මෙහිදී අදාල ලියාපදිංචිය ඉල්ලුම් කරන ක්ෂේත්‍රයේ අංකය සමඟ ඔබගේ ආයතනයේ නම ලදුපතේ නිවැරදිව සඳහන් කිරීම කලයුතු අතර ලදුපතේ "තැන්පතුවේ අවශ්‍යතාවය" ස්ථානයේ " සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය 2026" ලෙසද සඳහන් කිරීම මඟින් බැංකු ගිණුම් විස්තරයේ අදාල තොරතුරු නිවැරදිව හා පැහැදිලිව සටහන් විය යුතුය. එබැවින් සෘජුව බැංකුව වෙත තැන්පත් කිරීමේදී අදාල තොරතුරු නිවැරදිව සඳහන් නොවීම මත ඔබගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වීම වලක්වා ගැනීමට අයදුම්කරුවන් වගබලා ගත යුතුය.

**vii.** අයදුම්පත්‍රය සමග භාණ්ඩ හා සේවා සඳහා විස්තරාත්මක කාණ්ඩ ලැයිස්තුව නිකුත් කරනු ලබන අතර එක් කාණ්ඩයකට වැඩි කාණ්ඩ ප්‍රමාණයක් ලියාපදිංචි වීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා වෙන වෙනම අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එක් කාණ්ඩයක් තුළ අයිතම කිපයක් සඳහා එකම පත්‍රයක් මගින් ලියාපදිංචි විය හැකිය.

**viii.** අයදුම්පත් සම්පූර්ණ කර රබර් මුද්‍රාව යොදා අත්සන් කළ යුතුය. අයදුම්පත් <u>තැපැලෙන් පමණක්</u> **2025.12.01** දින ප.ව **3.00**ට පෙර අධ්‍යක්ෂ ජනරාල්, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, තැ.පෙ.**14**, පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ සැපයුම්කරුවන් විසින් "සැපයුම්කරුවන් ලියාපදිංචිය **-2026**" ලෙසද කොන්ත්‍රාත්කරුවන් විසින් "කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය **-2026**" යනුවෙන් සඳහන් කළ යුතුවේ. වැඩිමනක් විස්තර අවශ්‍ය වන්නේ නම් **081-2388654** දුරකථන අංකය මගින් මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී ඇමතීමෙන් ලබා ගත හැකිය. අයදුම්පත් භාරගැනීම **2025.12.01** වන දින ප.ව **3.00** න් අවසන් වේ.

සභාපති.<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,<br>
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව,<br>
පේරාදෙණිය.<br>
**2025.10.15**